ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපන)ගෞරව උපාධි වැඩසටහන 2020/2021
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2021
SNU6221/ESU4121- ප්‍රාථමික අධ්‍යාපනය
කාලය පැය තුනයි. (03)

032

---

දිනය - 2021.04.25 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගන්නා ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ආරක්ෂණ අයිතිය යන යෙදුමෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

03. ප්‍රාථමික ගුරුවරයාට සම්පත් කළමනාකරුවෙකු ලෙස ඔහුගේ/ඇයගේ භූමිකාව හැසිරවිය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රාථමික පාසලේ සිසුන් ඉගෙනුම ලබන ක්‍රම හතරක් (04) ලැයිස්තු ගත කරන්න.

05.

| | | |
|---|---|---|
| 45 | 32 | 84 |
| - 26 | - 17 | - 57 |
| 21 | 25 | 33 |

3 ශ්‍රේණියේ ශිෂ්‍යයකු විසින් ඉහත එකතුව ලැබෙන පරිදි ගණන් සාදන ලදී. අඩු කිරීමේ දී ශිෂ්‍යයා කරන ලද දෝෂය හඳුනා ගන්න.
ඔබ විසින් හඳුනාගෙන ඇති දෝෂ නිවැරදි කිරීම සඳහා ඔබේ යෝජනා මොනවා ද?

06. සැමට අධ්‍යාපනය පිළිබඳ ලෝක ප්‍රකාශනය කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. 1972 දී හඳුන්වා දෙන ලද ප්‍රාථමික අධ්‍යාපන අංග කෙටියෙන් විස්තර කරන්න.

08. ඉගෙනීමට ඉගෙනීම මූලික නිපුණතාවකි. අදාළ උදාහරණයන් සමග "ඉගෙනීමට ඉගෙනීම" පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (I) ප්‍රාථමික පාසලේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය සඳහා ඕනෑම ශ්‍රේණියකින් තේමාවක් තෝරා ගන්න. (ලකුණු 04)

(II) තෝරා ගන්නා ලද තේමාව සඳහා කෙටියෙන් පාඩම් සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 10)

(III) ඉහත පාඩම් සැලැස්මට අනුව සිසුන් තක්සේරු කිරීම සඳහා උචිත පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 06)

10. (I) 1972 වර්ෂය ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ සුවිශේෂී වසරක් විය. ඔබ මෙම වගන්තිය සඳහා එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සාධාරණීය කරන්න. (ලකුණු 10)

(II) 1972 වර්ෂයේ සිට ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් විස්තර කරන්න. (ලකුණු 10)

11. (I) ප්‍රාථමික අධ්‍යාපනයේ අරමුණු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 06)

(II) ප්‍රාථමික පාසලේ විෂයමාලාව සඳහා දාර්ශනික අදහස් බෙහෙවින් බලපා ඇත. මහත්මා ගාන්ධි දාර්ශනික අදහස්වල බලපෑම පහත දැක්වෙන කරුණු මත විමසන්න.

- ප්‍රාථමික පාසලේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද
- ගුරුවරයා - සිසුවා සම්බන්ධතාව
- පන්තිකාමර පරිසරය (ලකුණු 14)

12. (I) ළමුන්ගේ මුල් ප්‍රාථමික වසරවල සංවර්ධනාත්මක ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06)

(II) ඔබ ඉහත සඳහන් කළ ලක්ෂණ අතරින් තුනක් (03) තෝරාගෙන ඒ අනුව ළමුන්ගේ නිපුණතා වර්ධනය කර ගැනීම සඳහා ගුරුවරයා පන්ති කාමරයේ ඉගෙනුම් පරිසරය සකස් කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 14)

13. (I) ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් සඳහා ඉගෙනුම් අවස්ථා සම්පාදනයේ දී වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දෙන අභියෝග ලැයිස්තුවක් සකස් කරන්න. (ලකුණු 08)

(II) ප්‍රාථමික පාසල් වයසේ පසුවන ප්‍රාථමික අධ්‍යාපනය නොලැබෙන ළමුන් කණ්ඩායමක් සඳහා මැදිහත්වීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්න. (ලකුණු 12)

14. (I) තක්සේරු කිරීම යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

(II) ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ක්‍රම මොනවා ද? (ලකුණු 07)

(III) ප්‍රාථමික අධ්‍යාපනයේ තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ අවිධිමත් තක්සේරු කිරීම් විධිමත් තක්සේරුවට වඩා ඵලදායී වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.